# පෘතුගීසි පාලන සමයේ දී මෙරට වෙළඳාමට හඳුන්වා දුන් රිදී කාසි ත්‍රිත්වය පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම.

**ජයසිංහ ඩී.ඩී.ඩී.එම්**[1]

ශ්‍රී ලංකාවේ කෝට්ටේ රාජධානි සමයේ එනම් ක්‍රි.ව. 1505 දී පෘතුගීසීන්ගේ ලංකාගමනය සිදුවිය. පෘතුගීසීන් මෙරට වෙළඳාමට සෘජුවම සම්බන්ධ වූ අතර එමඟින් පෘතුගීසී කාසි භාවිතය මෙරට වෙළඳාමට එක් විය. මෙරට භාවිතය සඳහා පෘතුගීසීන් විසින් රිදී කාසි තුන් වර්ගයක් හඳුන්වා දී ඇත. එම කාසී තුන් වර්ගයේ ගති ලක්ෂණ පිළිබඳව විර්ශනයක් කිරීම මෙහි පර්යේෂණ ගැටළුව වේ. මේ සඳහා සාහිත්‍යමය මූලාශ්‍රය, අන්තර්ජාලය වැනි ක්‍රමවේද භාවිතා කරන ලදි. මෙරට වෙළඳාමට සෘජුවම සම්බන්ධ වූ පෘතුගීසීන් ක්‍රි.ව. 1597 දී කාසි අච්චු ගසන ලදී. එම කාසි අතර රිදී කාසී තෙවර්ගයක් හඳුනාගත හැක. එක් වර්ගයක් ශාන්තුවර කාසියයි. කාසියේ එක් පැත්තක කිරුළු පලන් ප්‍රතිකාල් රාජ්‍ය ලාංඡනයක් ඇත. මෙම කාසි ගෝවේ දී ප්‍රථම වරට මුද්‍රණය කළ ඒවා නිසාවෙන් කාසියේ දෙපස ගෝව හැඳින්වීම සඳහා "ය්"අකුරු යොදා ඇත. කාසියේ අනෙක්පස හිටගත් ශාන්තුවරයෙකුගේ රූපසටහනකි. එම රූපය දෙපස එය හඳුන්වන්නට ST හෝ SF හෝ SI හෝ යන අකුරු යොදා ඇත. එම අක්ෂර වලින් එක් එක් මුණිවරයන් හඳුන්වා ඇත. මෙම කාසි ක්‍රි.ව. 1632-1656 කාලයේ නිකුත් කොට ඇත. අනෙක් වර්ගය මලක්කා කාසියයි. මෙම කාසියේ උඩ පැත්තෙහි "AM" හෝ "MA" හෝ "DM" යන අකුරු කිරුළු පලන් පෘතුගීසි රාජ්‍ය ලාංඡනයක දෙපසින් සඳහන් වී ඇත. මෙම කාසි වර්ගයද ප්‍රථමයෙන් ගෝවේ නිෂ්පාදනය කර ඇති හෙයින් කාසියේ ය් යනුවෙන් දක්වා ඇත. ක්‍රි.ව. 1632 - 1649 කාලයේ නිකුත් කළ කාසි මෙරටින් හමු වී තිබේ. අනෙක් රිදී කාසි වර්ගය ගිනිමැස්ස කාසියයි. මෙය කොළඹ නාවිකයන්ට පමණක් නිකුත් කළ කාසියකි. එක් පසෙක පෘතුගීසි රාජ්‍ය ලාංඡනය ද "ක්‍ෂ" හෝ "ය්" යන අකුරු ද සඳහන් වේ. අනෙක් පස ගිනිමැස්සක සංකේතයකි. ඒ දෙපස කාසිය නිකුත් කළ වර්ෂය දක්වයි. කොළඹට පැමිණි පෘතුගීසින් කුඩා බලකොටුවක් සාදා එය ලෝරන්ස් සාන්තුවරයාට කැප කොට ආපසු ගියහ. ඉන්පසු එම සාන්තුවරයා ගිනිමැස්සක් මත තබා පිළිස්සීමෙන් මියගිය අතර එය පෘතුගීසින්ගේ කණගාටුවට පුවතක් විය. එම සිද්ධිය ස්මරණය කිරීමට මෙම කාසියට ගිනිමැස්සේ සංකේතය යොදා ඇත. ක්‍රි.ව. 1640-1645 කාලයේ මෙම කාසි නිෂ්පාදනය කර ඇත. මේ අයුරින් මෙරටට පැමිණි පෘතුගීසින් මෙරට භාවිතයට එක් කළ රිදි කාසි තෙවර්ගය පිළිබඳ හඳුනාගත හැකිය. ඒවායේ ගති ලක්ෂණ අනුව එම කාසි මගින් පෘතුගීසින් සිය අනන්‍යතාවය මෙරටට පෙන්වා දීමට ගත් තවත් උත්සහයක් බව අවසාන වශයෙන් නිගමනය කළ හැක.

**මුඛ්‍ය පද :** කාසි, පෘතුගීසින්, මුද්‍රණය, ගෝව

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
madushandinelka@gmail.com